# ප්‍රසම්පාදන නිවේදනයයි.
# අමු/පිසු ආහාර සැපයිම - 2026
# ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන පහත සඳහන් රෝහල් වලට **2026.01.01** සිට **2026.12.31** දින දක්වා කාල සීමාවට පිසු ආහාර සැපයිම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| පැකේජ් අංකය | රෝහල | ලංසු ආකෘති පත්‍ර ගාස්තු මුදලින් (රු:) | ලංසු සුරක්ෂණය (රු:) | වත්කම් සහතිකයේ වටිනාකම(රු:) |
|---|---|---|---|---|
| **A ශ්‍රේණියේ මූලික රෝහල්** | | | | |
| 01 | මූලික රෝහල දියතලාව | 7,000.00 | 353,000.00 | 700,000.00 |
| 02 | මූලික රෝහල මහියංගණය | 12,500.00 | 522,000.00 | 700,000.00 |
| **B ශ්‍රේණියේ මූලික රෝහල්** | | | | |
| 03 | මූලික රෝහල බිබිල | 5,000.00 | 163,000.00 | 600,000.00 |
| 04 | මූලික රෝහල වැලිමඩ | 7,000.00 | 304,000.00 | 500,000.00 |
| 05 | මූලික රෝහල වැල්ලවාය | 5,000.00 | 139,000.00 | 400,000.00 |
| 06 | මූලික රෝහල සියඹලාණ්ඩුව | 3,000.00 | 94,000.00 | 300,000.00 |
| 07 | මූලික රෝහල බණ්ඩාරවෙල | 3,000.00 | 75,000.00 | 280,000.00 |
| **A ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල්** | | | | |
| 08 | ප්‍රාදේශිය රෝහල පස්සර | 3,000.00 | 94,000.00 | 300,000.00 |
| 09 | ප්‍රාදේශිය රෝහල බුත්තල | 3,000.00 | 67,000.00 | 275,000.00 |
| **B ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල්** | | | | |
| 10 | ප්‍රාදේශිය රෝහල හපුතලේ | 2,000.00 | 43,000.00 | 250,000.00 |
| 11 | ප්‍රාදේශිය රෝහල ඌව පරණගම | 3,000.00 | 57,000.00 | 270,000.00 |
| 12 | ප්‍රාදේශිය රෝහල කන්දකැටිය | 3,000.00 | 52,000.00 | 270,000.00 |
| 13 | ප්‍රාදේශිය රෝහල ලුණුගල | 3,000.00 | 58,000.00 | 270,000.00 |
| 14 | ප්‍රාදේශිය රෝහල ගිරාඳුරුකෝට්ටේ | 3,000.00 | 58,000.00 | 270,000.00 |
| 15 | ප්‍රාදේශිය රෝහල ඌරණිය | 2,000.00 | 27,000.00 | 200,000.00 |
| 16 | ප්‍රාදේශිය රෝහල මීගහකිවුල | 2,000.00 | 38,000.00 | 250,000.00 |
| 17 | ප්‍රාදේශිය රෝහල කොස්ලන්ද | 2,000.00 | 30,000.00 | 200,000.00 |
| 18 | ප්‍රාදේශිය රෝහල මැටිගහතැන්න | 2,000.00 | 43,000.00 | 250,000.00 |
| 19 | ප්‍රාදේශිය රෝහල මැදගම | 2,000.00 | 39,000.00 | 250,000.00 |
| 20 | ප්‍රාදේශිය රෝහල තණමල්විල | 2,000.00 | 45,000.00 | 265,000.00 |
| 21 | ප්‍රාදේශිය රෝහල බඩල්කුඹුර | 2,000.00 | 39,000.00 | 260,000.00 |
| 22 | ප්‍රාදේශිය රෝහල ඉඟිණියාගල | 2,000.00 | 23,000.00 | 200,000.00 |
| 23 | ප්‍රාදේශිය රෝහල කතරගම | 2,000.00 | 30,000.00 | 220,000.00 |
| **C ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල්** | | | | |
| 24 | ප්‍රාදේශිය රෝහල හල්දුම්මුල්ල | 2,000.00 | 36,000.00 | 250,000.00 |
| 25 | ප්‍රාදේශිය රෝහල කන්දේගෙදර | 2,000.00 | 30,000.00 | 200,000.00 |
| 26 | ප්‍රාදේශිය රෝහල හොප්ටන් | 2,000.00 | 30,000.00 | 225,000.00 |
| 27 | ප්‍රාදේශිය රෝහල සෙවනගල | 2,000.00 | 36,000.00 | 225,000.00 |
| 28 | ප්‍රාදේශිය රෝහල ස්ප්‍රිංවැලි | 2,000.00 | 38,000.00 | 250,000.00 |
| 29 | ප්‍රාදේශිය රෝහල බොරලන්ද | 2,000.00 | 32,000.00 | 225,000.00 |
| 30 | ප්‍රාදේශිය රෝහල ඇටැම්පිටිය | 2,000.00 | 33,000.00 | 240,000.00 |
| 31 | ප්‍රාදේශිය රෝහල දෙමෝදර | 2,000.00 | 40,000.00 | 250,000.00 |
| 32 | ප්‍රාදේශිය රෝහල බෝගහකුඹුර | 2,000.00 | 30,000.00 | 225,000.00 |
| 33 | ප්‍රාදේශිය රෝහල කැන්දගොල්ල | 3,000.00 | 50,000.00 | 250,000.00 |
| 34 | ප්‍රාදේශිය රෝහල මීරහවත්ත | 2,000.00 | 29,000.00 | 220,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 35 | ප්‍රාදේශීය රෝහල මීදුම්පිටිය | 3,000.00 | 52,000.00 | 265,000.00 |
| 36 | ප්‍රාදේශීය රෝහල හම්බේගමුව | 2,000.00 | 25,000.00 | 200,000.00 |
| 37 | ප්‍රාදේශීය රෝහල ඔක්කම්පිටිය | 2,000.00 | 32,000.00 | 200,000.00 |
| 38 | ප්‍රාදේශීය රෝහල රෝබේරිය | 2,000.00 | 28,000.00 | 210,000.00 |
| 39 | ප්‍රාදේශීය රෝහල ග්ලැනෝර් | 2,000.00 | 24,000.00 | 200,000.00 |
| 40 | ප්‍රාදේශීය රෝහල නැදුන්ගමුව | 2,000.00 | 32,000.00 | 220,000.00 |
| 41 | ප්‍රාදේශීය රෝහල ගලඋඩ | 2,000.00 | 26,000.00 | 200,000.00 |
| 42 | ප්‍රාදේශීය රෝහල ඇකිරියන්කුඹුර | 2,000.00 | 27,000.00 | 200,000.00 |
| 43 | ප්‍රාදේශීය රෝහල දඹාන | 2,000.00 | 24,000.00 | 210,000.00 |
| 44 | ප්‍රාදේශීය රෝහල කහටරුප්ප | 2,000.00 | 29,000.00 | 210,000.00 |
| 45 | ප්‍රාදේශීය රෝහල දඹගල්ල | 2,000.00 | 29,000.00 | 200,000.00 |
| 46 | ප්‍රාදේශීය රෝහල හිඟුරුකඩුව | 1,500.00 | 20,000.00 | 210.000.00 |
| 47 | ප්‍රාදේශීය රෝහල ඇතිමලේ | 2,000.00 | 23,000.00 | 225,000.00 |
| 48 | ප්‍රාදේශීය රෝහල පිටකුඹුර | 1,500.00 | 16,000.00 | 200,000.00 |
| 49 | ප්‍රාදේශීය රෝහල හඳපානාගල | 1,500.00 | 19,000.00 | 210,000.00 |

(I) අසාධු ලේඛනගත නොවූ ශ්‍රී ලාංකික පුරවැසියෙකු, රජයේ ලියාපදිංචි සමිතියක් හෝ සමාගමකට මේ සඳහා ඉදිරිපත් විය හැකිය. එමෙන්ම රජයේ ලියා පදිංචි සමාගමක් නම් එය ශ්‍රී ලංකාවේම ක්‍රියා කිරීම සඳහා බලය ඇති ආයතනයක් විය යුතු අතර, පසුගිය වසරේ විගණනය කළ අවසන් ගිණුම් වාර්තාව හෝ බැංකු ගිණුමේ පසුගිය තෙමසේ බැංකු ප්‍රකාශය ඉදිරිපත් කල හැකි විය යුතුය.

(II) **2025.09.01** දිනට පසු ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද **"පොදු 170"** ආකෘතියේ වත්කම් සහතිකයේ වටිනාකම තිරුවේ සඳහන් වටිනාකමට වත්කම් සහතික හා ස්ථිර පදිංචිය පිළිබඳ සහතියක් අදාල ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය.

(III) ඉහත වගුවේ සඳහන් ලංසු සුරක්ෂණ ගාස්තුව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නමින් ඇති බදුල්ල මහජන බැංකුවේ ගිණුම් අංක **269-100188440649** දරණ ජංගම ගිණුමට තැන්පත් කර එම තැන්පතු ලදුපත ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් සහකාර වෙත ඉදිරිපත් කර ඒ සඳහා කුවිතාන්සි පතක් ලබා ගෙන එහි මුල් පිටපත ලංසු ආකෘති පත්‍ර සමඟ ඉදිරිපත් කල යුතුය. නැතහොත් නියමිත වටිනාකමට අදාළව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලූවිට ගෙවනු ලබන, **2026.03.13** දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ හැකිය.

(IV) ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉහත වගුවේ සඳහන් ලංසු ආකෘති පත්‍ර ගාස්තුව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් සහකාර වෙත මුදල් ගෙවා කුවිතාන්සියක් ලබා ගෙන, එම කුවිතාන්සිය ඉදිරිපත් කර සතියේ වැඩකරන දිනවල පෙ.ව **9.00** සිට ප.ව. **3.00** දක්වා ලංසු ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

(V) **C** ශ්‍රේණියේ හෝ **B** ශ්‍රේණියේ ප්‍රාදේශීය රෝහලක වසරක කාලයක් සඳහා පිසූ ආහාර සාර්ථකව ලබාදී පලපුරුද්දක් ඇත්නම් **A**ශ්‍රේණියේ ප්‍රාදේශීය රෝහල් සඳහා ද, **A** හෝ **B** ශ්‍රේණියේ ප්‍රාදේශීය රෝහලක වසර දෙකක කාලයක් සඳහා ආහාර සාර්ථකව ලබාදී පලපුරුද්දක් ඇත්නම් **B** ශ්‍රේණියේ මූලික රෝහල් සඳහාද, **B** ශ්‍රේණියේ මූලික රෝහලක වසර දෙකක කාලයක් සඳහා පිසූ ආහාර සාර්ථකව ලබාදී පලපුරුද්දක් ඇත්නම් **A** ශ්‍රේණියේ මූලික රෝහලක් සඳහාද ඉල්ලුම් කිරීමට හැකියාව ඇත. **C** හා **B** ශ්‍රේණියේ ප්‍රාදේශීය රෝහල් සඳහා පලපුරුද්දක් අවශ්‍ය නොවේ.

(VI) එක් එක් රෝහල් සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු ආකෘති පත්‍ර යුගලය එනම් මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා කවරයේ වම් පස ඉහල කෙලවරේ (රෝහලේ නම) **"..............**රෝහලේ ආහාර සැපයීමේ ලංසු **2026"** යනුවෙන් සඳහන් කර ඊට පහලින් අයඳුම්කරුගේ නම හා ලිපිනය සඳහන් කළ යුතුවේ.

(VII) ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් **2025.10.24** දින සිට **2025.11.13** වන දින දක්වා පෙ.ව. **9.00** සිට ප.ව.**3.00** දක්වා ලංසු ආකෘතිපත්‍ර නිකුත්කරනු ලබන අතර, **2025.11.14** දින ප.ව. **2.00** දක්වා ලංසු ආකෘතිපත් භාර ගනු ලැබේ. එදිනම ප.ව.2.30 ට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රැස්වීම් ශාලාවේදී ලංසුපත් විවෘත කරනු ලබයි. ඒ අනුව, අදාල ලංසු නියමිත වේලාවට පෙර ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය

යුතුවේ. නැතහොත් එකී වේලාවට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය , අංක 301, ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, නියමිත දින නියමිත වේලාවෙන් පසු ලැබෙන ලංසු පත්‍ර, විවෘත කිරීමකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(VIII) ලංසු ආකෘතිපත් විවෘත කරන අවස්ථාවට ලංසු පත් ඉදිරිපත් කළ ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකු සහභාගි කරවිය හැකි අතර, ඔහු විසින් තම අනන්‍යතාවය තහවුරු කිරීමට සමත් විය යුතුය.

(IX) රුපියල් මිලියන 05 වැඩි වටිනාකම් සහිත ලංසු සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මඟින් ලබා ගන්නා ලද පොදු කොන්ත්‍රාත් ගිවිසුමේ පිටපතක් අමුණා ඉදිරිපත් කල යුතුය. ඒ අනුව (දියතලාව, මහියංගණය, වැලිමඩ, බිබිල, සියඹලාණ්ඩුව, වැල්ලවාය, බණ්ඩාරවෙල මූලික රෝහල් හා පස්සර, බුත්තල, ලුණුගල, ඌව පරණගම, කන්දකැටිය, ගිරාඳුරුකෝට්ටේ, කැන්දගොල්ල, මීදුම්පිටිය යන ප්‍රාදේශිය රෝහල් සඳහා පොදු කොන්ත්‍රාත් ගිවිසුම ඉදිරිපත් කල යුතුය.)

(X) රෝගීන්ට ආහාර සැපයීම ඉතා වගකිව යුතු කාර්යයක් වන හෙයින් ලංසු කොන්දේසි උල්ලංඝණය කරන අයඳුම්කරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිගැනීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ. තෝරා ගත් ලංසු කරුට ඒ බව දැනුම්දී සති 02ක් ඇතුලත දී නියම කරනු ලබන ගිවිසුම් ඇප මුදල, මුදලින් තැන්පත් කර බැංකු ඇපකරයක් ඉදිරිපත් කර ගිවිසුමට එළැඹිය යුතු අතර, ආහාර සැපයීම 2026.01.01 දින සිට ආරම්භ කළ යුතුවේ.

(XI) පිසූ ආහාර සැපයීමට අදාලව පූර්ව ලංසු සාකච්ඡාවක් 2025.11.06 වන දින ප.ව. 2.00 ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන බැවින්, ඒ සඳහා උනන්දුවක් දක්වන අයට සහභාගි විය හැකිය.

(XII) මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.up.gov.lk වෙබ් ලිපිනයට පිවිසීමෙන් විස්තරාත්මක තොරතුරු ලබා ගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
අංක 301, ආර්.එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල.
දුරකථන අංකය (- 055 – 2231981) ෆැක්ස් අංකය (-055 – 2223098)